ජාතික කාන්තා කමිටුව
කාන්තා හා ළමා කටයුතු
සහ වියළි කලාප සංවර්ධන
අමාත්‍යාංශය

ස්ත්‍රී-පුරුෂ සමාජභාව අධ්‍යයන හා
කාන්තා ප්‍රවර්ධන ඒකකය,
කෘෂිව්‍යාප්ති අධ්‍යයනාංශය,
කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# දේශපාලනයේදී කාන්තාවන් බලගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව 2019 (තෙවන බඳවා ගැනීම)

## අයදුම්පත් කැඳවීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂි ව්‍යාප්ති අධ්‍යයනාංශයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාව අධ්‍යයන හා කාන්තා ප්‍රවර්ධන ඒකකය සහ කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටුව ඒකාබද්ධව පවත්වනු ලබන දේශපාලනයේදී කාන්තාවන් බලගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවේ තෙවන කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| පාඨමාලාවේ අරමුණ | - නායකත්ව ගුණාංග වර්ධනය කරමින් කාන්තාවන්ට දේශපාලන ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලබාදීම. |
| පාඨමාලා කාලසීමාව | - මාස අටකි (08) (අර්ධකාලීන සති අන්ත) |
| පාඨමාලා මාධ්‍යය | - සිංහල |
| පාඨමාලා ගාස්තුව | - රු.25,000.00 |

**ඇතුළත්වීමේ සුදුසුකම්**

- ✔ අවම වශයෙන් අ.පො.ස (උසස් පෙළ) විභාගය සමත් හෝ
- ✔ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සිංහල හා ගණිත විෂයන් ඇතුළත්ව අවම වශයෙන් විෂයන් 05 ක් සමත් සහ
- ✔ දේශපාලන කටයුතුවල නියැලී අවම වශයෙන් වසර තුනක (3) පළපුරුද්ද

ඉහළම සුදුසුකම් සපුරන අයදුම්කරුවන් වෙනුවෙන් පාඨමාලාව හැදෑරීමට පාඨමාලා ගාස්තුව සඳහා පූර්ණ ශිෂ්‍යත්වයක් ජාතික කාන්තා කමිටුව මඟින් ලබා දෙනු ඇත.

**අයදුම්පත් යොමු කිරීම** - නම, ලිපිනය, දුරකතන අංකය, අධ්‍යාපන සුදුසුකම්, ප්‍රජා කටයුතු සහ දේශපාලන ක්‍රියාකාරීත්වය තහවුරු කළ හැකි තොරතුරු ඇතුළත් කොට තමන් විසින් සකසන ලද අයදුම්පතක් මඟින් ඉල්ලුම් කළ හැක. උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික සහ අනෙකුත් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2019 අප්‍රේල් 12**

**අයදුම්පත් එවිය යුතු ආකාරය** - ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ දේශපාලනයේදී කාන්තාවන් බලගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව ලෙස සඳහන් කර සම්බන්ධීකාරක, ස්ත්‍රී-පුරුෂ සමාජභාව අධ්‍යයන හා කාන්තා ප්‍රවර්ධන ඒකකය, කෘෂි ව්‍යාප්ති අධ්‍යයනාංශය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය වෙත යොමු කරන්න.

සම්බන්ධීකාරක, ස්ත්‍රීපුරුෂ සමාජභාව අධ්‍යයන හා කාන්තා ප්‍රවර්ධන ඒකකය
කෘෂි ව්‍යාප්ති අධ්‍යයනාංශය, කෘෂිකර්ම පීඨය.